# වග දුම්රිය ස්ථානය සතු කාර්මික පුරාවිද්‍යා උරුමයේ වටිනාකම

එන්. එල්. ධනුෂ්ක පද්ම ලාල්*

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන කාලය තුළ කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව තුළ දුම්රිය ස්ථාන ඉදි කරන ලදී. වග දුම්රිය ස්ථානය ද ක්‍රි . ව 1901 කාලයේ ඉදි වූවකි. මෙම ස්ථානය බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ ලබුගම - කළුඅග්ග මාර්ගයේ වග නම් ප්‍රදේශයේ ඉදිව ඇත. මෙය මරදානේ සිට සැතපුම් 27 1/2 ක් දුරින් කැලණිවැලි දුම්රිය මාර්ගයේ පිහිටා ඇත. මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ වන්නේ වග දුම්රිය ස්ථානය සතුව පවතින කාර්මික වටිනාකම දැක්වීමයි. මෙම ස්ථානය ආශ්‍රිත ව බ්‍රිතාන්‍ය නිර්මාණ රැසක් වේ. ගඩොලින් නිර්මාණය කරන ලද ගබඩා ගොඩනැගිල්ලක් හා ලී සොල්දරයක් සහිත දුම්රිය ස්ථාන ගොඩනැගිල්ල ද බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යා ලක්ෂණ පෙන්නුම් කරයි. මෙම ස්ථානය සතුව යකඩින් නිර්මාණය කළ ජල ස්ථම්භයක් සහ විශාල ජල පයිප්පයක් දැක ගත හැක.

ශ්‍රී ලංකාවේ පාලම් තාක්ෂණයේ මුල් කාලීන යකඩ පාලමක් ලෙස මෙම ස්ථානය අසලින් ගලා බසින වක් ඔය හරහා ඉදිව ඇත. මෙය බ්‍රිතාන්‍ය කර්මාන්ත ශාලාවක ඉදි කරන ලද්දකි. මෙහි අතීතයේ භාවිතා වූ දුරකථන, සංඥා පුවරු, ටැබ්ලට් උපකරණ, මගී දැන්වීම් පුවරු දැක ගත හැක. කැලණිවැලි අතීත දුම්රිය මාර්ගයේ අඩි 2 1/2 ක පටු මාර්ගයකින් සමන් විත විය. 1994.11.01 දින දියත් කළ මාර්ගය පළල් කිරීමේ අදියර හරහා වත්මන් තත්වයට පත් විය. අතීතයේ දී තේ, රබර් ආශ්‍රිත ගබඩාවක් වශයෙන් මෙන් ම වතු වේදිකාවක් ලෙස ද මෙම ස්ථානය භාවිත විය. දුම්රිය එන්ජින් වලට ජලය සපයන නැවතුම් පොලක් ලෙස ද එකල භාවිතයට ගත් බවට සාධක වේ. අද වන විට මෙහි පැරණි ගබඩා ගොඩනැගිල්ල, සංඥා පුවරු, ජල ස්ථම්භය හා ජල පයිප්පය ද භායනයට ලක්වෙමින් පවතී. වර්තමානය විට සීමිත දුම්රිය වාර සේවයක් ක්‍රියාත්ම වන වග දුම්රිය ස්ථානය කාර්මික උරුමයක් ලෙස සුරක්ෂිත කර අනාගතයට රැක දීම අපගේ යුතුකමයි.

ප්‍රමුඛ පද - කාර්මික උරුමය, වග දුම්රිය ස්ථානය, බ්‍රිතාන්‍ය යුගය, සංඥා පුවරු

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය bestofdanuska@gmail.com